04

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
හයවන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU6410 -යෞවනයින් පිළිබඳ මනෝවිද්‍යාව**
කාලය- පැය තුනයි. (03)

---

දිනය - 2024.12.21 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>01- වන කොටස</u>

01. ගුරුවරයෙකු සඳහා නව යෞවන අවධිය පිළිබඳ අධ්‍යන කිරීමේ වැදගත්කම හේතු දෙකක් **(02)** දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. පාරිසරික ඉගෙනුම් පර්යාලෝකයට අනුව නවයෞවන වියෙහි සංවර්ධනය සිදුවන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න.

03. නව යෞවුන් විය ආතති සහිත හෝ කැළඹිලි සහිත කාල පරිච්ඡේදයක් ලෙස සලකන්නේ ඇයිදැයි උදාහරණ දෙකක් **(02)** සපයමින් සාකච්ඡා කරන්න.

04. ශාරීරික වෙනස්කම් නිසා නව යෞවනයන් මුහුණ දෙන ගැටලු දෙකක් **(02)** පැහැදිලි කරන්න.

05. ළමයින්ගේ සහ නව යෞවනයන්ගේ චින්තන ක්‍රියාවලීන් අතර ඇති වෙනස්කම් තුනක් **(03)** දක්වන්න.

06. නව යොවුන් වියෙහි ආත්ම කේන්ද්‍රීයබවේ ලක්ෂණ දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න.

07. දෙමාපියන්ගේ භූමිකාව නව යොවුන් වියේ දරුවන්ගේ සමාජ සංවර්ධනයට බලපාන ආකාරය උදාහරණ දෙකක් **(02)** දක්වමින් සාකච්ඡා කරන්න.

08. නව යොවුන් වියේ බහුලව දක්නට ලැබෙන පෞරුෂ ආබාධ දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - කොටස

09. (i.) මනෝ විද්‍යාඥයින් විසින් නව යොවුන් වියෙහි කායික වෙනස්කම් අනුක්‍රමික අදියර තුනක් ඔස්සේ සලකා බලනු ලැබේ. එම අදියර තුන **(03)** නම් කරන්න.

(ලකුණු 03)

(ii.) ඉහත (i.) සඳහන් කළ අදියරයන්ගෙන් එකක් තෝරා ගෙන එම අදියරෙහි ඇතිවන කායික වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(iii.) කායික වෙනස්කම් වලට හැඩ ගැසීමට නව යොවුන් වියේ දරුවන්ට උපකාර කිරීමේදී ගුරුවරයෙකු ලෙස ඔබේ භූමිකාව උදාහරණ තුනක් **(03)** දක්වමින් පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

10. ස්ටර්න්බර්ග් (Sternberg) (1988) ට අනුව විශ්ලේෂණ බුද්ධිය නිර්මාණාත්මක බුද්ධිය සහ ප්‍රායෝගික බුද්ධිය යනු මැදි යොවුන් වියේදී දැකිය හැකි බුද්ධි ආකාර තුනකි.

(i.) ඉහත සඳහන් එක් බුද්ධි ආකාරයක් තෝරා ගෙන එහි ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii.) නව යෞවනයන් තුළ (i.) දී තෝරා ගත් බුද්ධි ආකාරය පැවතීමෙහි ඇති වැදගත්කම උදාහරණ දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(iii.) ඔබ උගන්වන විෂය මත පදනම්ව පාඩමක් තෝරා ගෙන එම පාඩම තුළදී නව යෞවන වියෙහි සිටින සිසුන්ගේ ප්‍රජනන සංවර්ධනය සුසාධ්‍යකරණය කිරීම සඳහා ඔබට ක්‍රියාත්මක කළහැකි ඉගෙනුම් ක්‍රියාකාරකම් දෙකක් **(02)** සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

11. (i.) නව යොවුන් වියෙහි සමාජ සංවර්ධනයෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii.) නව යොවුන් වියෙහි සමාජානුයෝජන ක්‍රියාවලියේදී සමවයස් කණ්ඩායම්වල භූමිකාව උදාහරණ දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(iii.) නව යෞවන වියෙහි සිටින සිසුන්ගේ සිසුන්ගේ සමාජයීය සංවර්ධනය සුසාධ්‍යකරණය කිරීමට සමවයස් කාණ්ඩායම් වල සහාය ලබාගැනීමට නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකුට භාවිතා කළහැකි උපායමාර්ග දෙකක් **(02)** පැහැදිලි කරන්න.

(ලකුණු 10)

12. (i.) නව යොවුන් වියේදී සමබර පෞරුෂයක් පවත්වා ගැනීමේදී ඇති වැදගත්කම කරුණු දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) නව යොවුන් වියේ පෞරුෂ සංවර්ධනය සඳහා බලපාන සාධක තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) "යෞවනයන් අනන්‍යතාව ගොඩනැගීම සහ භූමිකාව ව්‍යාකූලත්වය අතර ගැටුමක් අත්විඳිති" එරික් එරික්සන් (Erik Erikson) විසින් ඉදිරිපත් කරන ලද මනෝ - සමාජ ප්‍රවේශය පදනම් කරගනිමින් මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

13. (i.) නව යෞවනයන්හට පොදු රුචිකත්වයන් තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii.) නව යෞවනයන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි එම රුචිකත්වයන් වැදගත් භූමිකාවක් නිරූපනය කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii.) නාට්‍ය හා රංග කලා /ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස ඔබ නව යෞවන වියෙහි සිටින සිසුන්ගේ රුචිකත්වයන් ඉටුකිරීමට ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

-නිමිකම් ඇවිරිණි.-